# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2188/4 - 2020 අගෝස්තු මස 10 වැනි සඳුදා - 2020.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : KDS/KGK/4/9/2018/01/LA.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/11/2018/UD/147.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවටකෝරළේ සුළු කොට්ඨාසයේ කටුකැලේ වසම (255) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කටුකැලේ (කොට්ඨාස අංක 18 කටුකැලේ) මහනුවර මහ නගර සභාව ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන සකස් කරන ලද 2020.04.30 දිනැති මූලික පිඹුරු අංක මහ 6996 හි කැබලි අංක 01 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0051 ක් වූ පහත සඳහන් ඉඩම් කැබැල්ල:

**කැබලි අංක 01**

ඉඩමේ නම: වරිපනම් අංකය - 185 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0051.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.09.16 දින පෙ.ව. 10.00 ට මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020.09.09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හි ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළය.

2020 ජූලි මස 31 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-518